**බද්දේගම ප්‍රාදේශීය සභාව - 2023**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බද්දේගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර පාසල් සඳහා මිලදී ගත් විදුලි පංකා වියදම රු.34,000 ක් වුවද, එය රු.114,305 ක් ලෙස ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම් ගතකර තිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ලේඛනාගාරයේ රාක්ක සෑදීම සඳහා දරන ලද රු.70,310 ක වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.413,840 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | බැංකුව වෙත ලැබී තිබුණු රු.60,586 ක සෘජු ප්‍රේෂණ හා කර්මාන්ත සඳහා ගෙවිය යුතු රු.437,734 ක් ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.110,000 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී කපා හැරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 සහ 571 | වසර 02 ක කාලයක් ඉක්ම වූ රු.754,186 ක තැන්පතු ශේෂ 25 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී සිදු කරන බව. | වසර 02 ක කාලයක් ඉක්ම වූ තැන්පතු ශේෂ පිළිබඳව සොයා බලා ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.7.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දී ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් වාර 04 ක් සඳහා සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර, එහි ඉන්ධන වෙනුවෙන් රු.187,818 ක් ගෙවීම් කර තිබුණි. | නැවත පළාත් පාලන ආයතන සඳහා සභිකයින් තෝරා පත්කර ගැනීමෙන් අනතුරුව මෙම ප්‍රවාහන පහසුකම් භාවිතා නොකරන බව. | පිරිවැය අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.37,237,241 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.76,522,030 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,526,443 | 7,778,380 | 6,009,653 | *10,819,398 | 5,191,041 | 4,810,368 | 4,402,458 | 9,148,681 |
| කුලී | 19,715,780 | 4,772,115 | 4,875,790 | 116,536 | 46,765,970 | 51,909,200 | 51,995,395 | 220,211 |
| බලපත්‍ර ගාස්තු | 1,733,200 | 1,093,826 | 923,926 | 169,900 | 2,200,362 | 761,565 | 761,565 | - |
| වෙනත් ආදායම් | 17,656,673 | 16,233,477 | 16,147,720 | 2,111,108 | 13,629,580 | 21,940,883 | 20,188,409 | 2,025,350 |
| | 46,632,096 | 29,877,798 | 27,957,089 | 13,216,942 | 67,786,953 | 79,422,016 | 77,347,827 | 11,394,242 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | සභාවේ අදහස් දැක්වීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.11,394,242 ක් වූ අතර වර්ෂය අවසානයට එම හිඟය රු.13,216,942 විය. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බද්දේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාර බදු ගෙවිය යුතු ආයතන 118 ක් වෙළඳ බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු ආයතන 29 ක් හා කර්මාන්ත බදු ගෙවිය යුතු ආයතන 06 ක් අදාළ ගාස්තු ගෙවා නොතිබුණි. ඒ තුළින් සභාවට රු.267,560 ක ආදායමක් අහිමි වී තිබුණි. | නියමිත මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | නියමිත පරිදි බදු හා බලපත්‍ර ගාස්තු අය කළයුතුය. |
| (ඇ) | දැන්වීම් පුවරු 74 ක් වෙනුවෙන් රු.1,064,100 ක මුදලක් සභාව අය කරගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවට අනුව දැන්වීම් පුවරු අය කිරීමට කටයුතු කරන බව. | දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,255,920 ක් හා මුද්දර ගාස්තු රු.79,629,105 ක් විය. | 2024 වර්ෂයේ අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබි යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයට පෙර මිලදී ගත් වර්ග 16 කට අයත් වටිනාකම රු.103,992 ක් වූ විදුලි තොග අයිතම 595 ක් භාවිතයෙන් තොරව ගබඩාවේ පැවති අතර, වර්තමානයේදී එම විදුලි තොග වර්ග වීථි පහන් සවි කිරීමේ දී භාවිතා නොකරන ඒවා බව නිරීක්ෂණය විය. | මෙම අයිතම සම්බන්ධයෙන් සොයා බලා ඉදිරියේ දී අපහරණය කිරීමට කටයුතු කරන බව. | අවශ්‍යතාවය සලකා බලා විදුලි තොග මිලදී ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ පොල ආදායම් එකතු කිරීම සඳහා විශ්‍රාම නිලධාරියෙකුට කිසිදු අනුමැතියකින් තොරව වාචිකව සභාවේ ආදායම් රැස් කිරීමට බලය ලබා දී තිබුණු අතර, ඒ සඳහා රු.348,842 ක් ගෙවීම් කර තිබුණි. | තවදුරටත් ලබා නොගැනීමට කටයුතු කළ බව. | ඉදිරියේ දී නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර බලපත්‍ර ලබා ගතයුතු ආයතන 20 කින් රු.90,000 ක ගාස්තු ගෙවා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගන්නා ලෙස ලිඛිතව දැනුවත් කිරීම් සිදුකර ඇති බව. | ජාතික පාරිසරික පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කැබ් රථය 2012 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණ ද, එය එම වසරේ සිට භාවිතා කර නොතිබුණි. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු මෙම රථය අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි අපහරණය කරන ලෙස දන්වා තිබුණ ද, එසේ කටයුතු කර නොතිබුණි. | අයිතිය පිළිබඳ ගැටළුව නිරාකරණය කර ගැනීමෙන් පසු විධිමත් පරිදි අපහරණ කටයුතු සිදු කරන බව. | වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 17(3) වගන්තිය ප්‍රකාරව සභාව සතු සියළුම දේපල සභාව විසින් පරිපාලනය කළයුතු වුවද, සභාව සතු ඉඩම් 30 ක වැට මායිම් දමා නොතිබූ අතර, ඉඩම් 11 ක අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මායිම් මැනීම හා මායිම් කණු සිටුවීම සිදු කරමින් පවතින බව. | ඉඩම් වල වැට මායිම් දමා අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු පිරිවැය සඳහන් නොවූ යන්ත්‍ර 04 ක් අළුත්වැඩියා නොකිරීම නිසා අවුරුදු 08 ත් 03 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ආයතනයේ යාන්ත්‍රික අංශය ලවා අළුත්වැඩියා කටයුතු සිදු කරන බව හා වතුර බවුසරය මේ වන විට භාවිතා කරන බව. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත යුතුය. |
| (ආ) | කොට්ඨාශ වශයෙන් වොලිබෝල් ක්‍රීඩාංගන 21 ක් ඉදිකර විදුලි ආලෝකය සැපයිම සඳහා විදුලි උපකරණ ලබාගෙන තිබුණු අතර, එයින් ක්‍රීඩාංගන 09 ක් පමණක් සාදා නිම කිරීම හේතුවෙන් අයිතම 16 ක් වෙනුවෙන් රු.177,668 ක් වටිනා වීථි පහන් උපකරණ ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි. | ක්‍රීඩාපිටිය ඉදි කිරීමට යෝජිත ස්ථානවල භූමිය පවරා ගැනීමේ දී ඇති වූ ගැටළු, පළාත් පාලන ආයතන වල නිල කාලය අවසන් වීමත් හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගුන වෙනත් ප්‍රායෝගික ගැටළු නිසා මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීමට සිදු වූ බව. | ගැටළු නිරාකරණය කරගෙන යෝජිත ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාසිදෙණිය වෙන්දේසි ඉඩමෙහි ක්‍රීඩාපිටිය සකස් කිරීම කර්මාන්තයේ වැඩ විෂය අංක 02 සඳහා ක්‍රීඩාංගනයෙන් ලබාගෙන තිබුණු පස් ඝණ මීටර් 830 ක් එස්කැවේටර් යන්ත්‍රය භාවිතා කර ඇතිරීම සිදුකර තිබුණු බැවින් මේ සඳහා නියමිත මිල අනුපාතය භාවිතා නොකිරීම නිසා රු.200,030 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදාළ නිල රේට් විග්‍රහ සටහන් නොලැබීම හේතුවෙන් මෙම භාවිතා කරන ලද රේටය භාවිතා කිරීම සිදු කරන ලද බව. | අදාළ නිල රේට භාවිතා කළ යුතුය. |